සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) දේව වචනයේ මූලාශ්‍රයක් වන ජීවන සහා සම්ප්‍රදාය පිළිබඳව කියවෙන ශුභාරංචිය වන්නේ,
(1) මතෙව් ශුභාරංචිය. (2) ජොහන් ශුභාරංචිය.
(3) ලූක් ශුභාරංචිය. (4) මාක් ශුභාරංචිය.

(02) ශුද්ධ බයිබලයේ නව ගිවිසුමේ වැඩිම පොත් ගණනක් ලියන ලද්දේ,
(1) ලූක් තුමා (2) පේදුරු තුමා
(3) පාවුලු තුමා (4) මාක් තුමා

(03) හෙරොද් ඇන්ටිපස්ගේ පාලන ප්‍රදේශය වූයේ,
(1) ජෙරුසෙලම (2) සමාරිය (3) බෙත්ලෙහෙම (4)ගලීලය

(04) පළමුවන හෙරෝද් අග්‍රිපා විසින් හිසගසා මරා දමනු ලැබුවේ,
(1) ස්නාවක ජුවාම් තුමා (2) ශු.මහ ජාකොබ් තුමා
(3) ශු. පාවුලු තුමා (4) ශු. පේදුරු තුමා

(05) ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍ය පොත් කාණ්ඩයට අයත් වන්නේ,

A - විරාවලිය

B - ගීතාවලිය

C - ප්‍රේම ගී

D - 1 වංශාවලිය

මේවායින් නිවැරදි පිළිතුර වන්නේ,
(1) B හා C (2) A හා B (3) B හා D (4) A හා D

(06) ශුද්ධ වූ මාක් තුමාගේ ශුභාරංචියේ පරමාර්ථයට අනුව අපගේ යුතුකමක් වන්නේ,
(1) දුක් පීඩා හමුවේ සත්‍ය විශ්වාසයට සාක්ෂි දැරීම.
(2) සමාජයේ අසරණ වූ කොන් වූ අයට අනුකම්පාව දැක්වීම.
(3) තම ජීවිතය ශුභාරංචියක් කරගෙන අන් අයගේ ප්‍රීතියට සැනසීමට දායක වීමයි.
(4) ප්‍රේමයේ, සමාව දීමේ, සාධාරණත්වයේ, සමාජයක් ගොඩනැගීමයි.

(07) සරල සාහිත්‍යමය භාෂා ශෛලයක් යොදාගෙන ඇති සම්ප්‍රදායක් වන්නේ,

(1) යාවේ සම්ප්‍රදාය (2) පූජක සම්ප්‍රදාය

(3) ද්විතීය නීති සම්ප්‍රදාය (4) එලොහිම් සම්ප්‍රදාය

(08) ශු. පාවුලු තුමා තුන්වන ධර්මදූත ගමනේ යෙදුනු ස්ථාන 03 ක් වන්නේ,

(1) සිලුකිය / ත්‍රෝවසය / එපීසය

(2) පිලිප්පිය / තාර්සස් / බෙරියාව

(3) සිරියාවේ අන්තියෝකය / තාර්සස් / පිලිප්පිය

(4) සිරියාවේ අන්තියෝකය / එපීසිය / ජෙරුසෙලම

(09) ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට ඔබ කළ යුත්තේ,

(1) දැහැමි ක්‍රියා ප්‍රසිද්ධියට පත්කර ගැනීම.

(2) පරාර්ථකාමීව අන් අයගේ සුභ සිද්ධිය උදෙසා වැඩ කිරීම.

(3) හැකි සෑම අවස්ථාවකදීම වගකීම් ඉටු කිරීම.

(4) තාක්ෂණයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම.

(10) '' මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නා වූ මාගේ දූතයා මම එවමි'' මෙසේ සඳහන් වන ග්‍රන්ථය කුමක් ද?

(1) යෙසායා ග්‍රන්ථය (2) දානියෙල් ග්‍රන්ථය

(3) මලාකි ග්‍රන්ථය (4) 1 රාජාවලිය ග්‍රන්ථය

(11) ස්නාවක ජොහාන් තුමාගේ දේශනයේ අරමුණ වූයේ ජනතාව................

(1) යුක්තිගරුක පුද්ගලයන් කිරීම යි. (2) සිත් හැරීමකට යොමු කිරීම යි.

(3) කිතු දහම ආරම්භ කිරීම යි. (4) පොදු සේවාවන් සඳහා යොමු කිරීම යි.

(12) ශුද්ධ වූ සභාවේ ප්‍රධාන ලක්ෂණයක් වන ඒකත්වයේ පදනම ලෙස හැඳින්වූයේ,

(1) ශුද්ධ වූ සභාව තුළ සියලු දෙනාම පුත්‍රයාණන් වහන්සේට අයිති බවයි.

(2) ජේසුස් වහන්සේ ශුද්ධ වූ සභාවේ හිස වන බවයි.

(3) ශුද්ධ වූ සභවේ විශ්වීය බව වර්ධනය වන්නේ ශුභාරංචිය තුළින් බවයි.

(4) ශුද්ධ වූ සභාවේ ඒකත්වය ශුද්ධ වූ ත්‍රිත්වය මත රැඳී ඇති බවයි.

(13) ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්යය මගින් ප්‍රකාශ වන්නේ,

(1) ජේසුස් වහන්සේ විවිධ සලකුණු මගින් ප්‍රකාශ වන බවය.

(2) ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බව ඔප්පු වූ බවය.

(3) ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමානව වැඩ සිටින බවය.

(4) ජේසුස් වහන්සේගේ ශ්‍රී සළුව එම ස්ථානයේ දී හමු වූ බවය.

(14) පස්වන හා හත්වන වසංගත අඩංගු වරණය වන්නේ,

A මැසි උවදුරු

B ගවසම්පත් වැනසීම

C කිනිතුළු උවදුර

D ගඩු උවදුර

E ගල් වර්ෂාව

(1) A හා C ය. (2) B හා E ය. (3) C හා D ය. (4) B හා D ය.

(15) මරිය හමුදාව (ලෙජියෝ මරියේ) නම් වූ ගිහි ධර්මදූත සමිතිය ආරම්භ කරන ලද්දේ,

(1) ෆ්‍රැන්ක් ඩෆ් මහතා (2) ගරු මයිකල් රුදීගු පියතුමා

(3) ශු.මැක්සිමිලියන් මුනිතුමා (4) ෆෙඩ්‍රික් ඕසානාම් පියතුමා

(16) ආරම්භක ප්‍රසාද නිධාන අඩංගු නිවැරදි වරණය වන්නේ,

(1) ප්‍රසාද ස්නාපනය / සමගි සන්ධානය / දිව්‍ය සත්ප්‍රසාදය

(2) ප්‍රසාද ස්නාපනය / දිව්‍ය සත්ප්‍රසාදය / පූජකවරය

(3) ප්‍රසාද ස්නාපනය / සමගි සන්ධානය / අභිවෘද්ධි ආලේපය

(4) ප්‍රසාද ස්නාපනය / දිව්‍ය සත්ප්‍රසාදය / අභිවෘද්ධි ආලේපය

(17) අභිවෘද්ධි ආලේපය මගින් අප ශුද්ධාත්ම වරමින් පූර්ණ කරන්නේ,

(1) කිතුනුවන්ගේ අභිවෘද්ධියට වැය විමටයි.

(2) අන්‍යන්ගේ උදහසට ලක් නොවී ජීවත් වීමට ය.

(3) අභියෝග හමුවේ විශ්වාසයට සාක්ෂි දැරීමටය.

(4) මිසම් සංඝයට පමණක් සේවය කිරීමටයි.

(18) '' දෙවිඳුන් ප්‍රිය පඬුරු නම්, බිඳුණු හදවතකි '' මෙසේ සඳහන් වන්නේ,

(1) ගීතාවලියේ ය.

(2) හිතෝපදේශයේ ය.

(3) ජෝවෙල් ග්‍රන්ථයේ ය.

(4) එළිදරව්ව ග්‍රන්ථයේ ය.

(19) මව්කුස සිටියදී මෙන්ම තම ජීවිත කාලය පුරාම දිව්‍ය සංරක්ෂණ අත්දුටු තැනැත්තෙකි,

(1) අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

(2) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා

(3) අති උතුම් XVI වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා

(4) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා

(20) ශ්‍රී ලංකාවේ වතුකම්කරුවන්ගේ අයිතිවාසිකම් රැකදීමට මූලික වෙමින් කටයුතු කළේ,

(1) ගරු මයිකල් රුදීගු පියතුමා (2) ගරු තිස්ස බාලසූරිය පියතුමා

(3) ගරු මර්සලීන් ජයකොඩි පියතුමා (4) ගරු අර්නස්ට් පොරුතොට පියතුමා

(21) '' ගබ්සාව '' බරපතල පාපයක් වන්නේ,

(1) ජීවිතයේ අයිතිය මිනිසා සතු වන නිසාය.

(2) ශුද්ධ වූ ත්‍රිත්වයේ අභිලාශයන්ට පටහැනිව යා නොහැකි නිසා ය.

(3) පිළිසිඳගත් මොහොතේ සිට ජීවිතය දෙවියන් වහන්සේට අයිති නිසා ය.

(4) දරුවාට දෙවියන් වහන්සේ ගේ දීමනා නොලැබෙන නිසා ය.

(22) තමාටත්, අසල්වැසියන්ට මෙන්ම දෙවියන් වහන්සේටත් විරුද්ධව කරන පාපයක් වන්නේ,

(1) මත්ද්‍රව්‍ය භාවිතය (2) සියදිවි නසා ගැනීම

(3) චරිත ඝාතනය කිරීම (4) සිත් රිදවීම් ඇති කරවීම

(23) ''මාගේ හඳ සමිඳුන් උසස් ලෙස පසසයි මාගේ ආත්මය මා... උදම් අනයි'' මෙසේ පවසන ලද්දේ,

(1) එළිසෙබත් තුමිය (2) සකරියස් තුමා

(3) ආබ්‍රහම් තුමා (4) මරිය මාතාවන්

(24) ඔබගේ ශරීරය, ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ, ඔබ තුළ වැඩ වසන ......................... මන්දිරය වන බව ඔබ නොදන්නාහු ද?, මෙහි හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) ක්‍රිස්තුන් වහන්සේගේ (2) දෙවියන් වහන්සේගේ

(3) ශුද්ධාත්මයාණන්ගේ (4) ශුද්ධ වූ සභාවේ

(25) සොරකම් කළ අය තවත් සොරකම් නොකරත්වා, ...........................වෙහෙස මහන්සි දරා අවංක වැඩක් කරත්වා! මෙසේ සඳහන් වන්නේ,

(1) එපීස ග්‍රන්ථයේය (2) 1 කොරෙන්ති ලිපියේය

(3) මහෝපදේශයේය (4) කතෝලික සභා ධර්මෝපදේශයේය.

(26) '' මා උපන්නෙත්, ලොව පහළ වූයේත් සත්‍යයට සාක්ෂි දරන පිණිසය. සත්‍යයේ සිටි සියල්ලෝ මාගේ හඬ අසති'' මෙය කවුරුන් විසින් කාහට පවසන ලද්දක්ද?

(1) ජේසුස් වහන්සේ විසින් මරියතුමියට

(2) ස්නාවක ජුවාම් තුමා විසින් ජේසුස් වහන්සේට

(3) ජේසුස් වහන්සේ විසින් පේදුරු තුමන්ට

(4) ජේසුස් වහන්සේ විසින් පිලාත්ට

(27) උත්තම පූජක යාච්ඤාව සඳහන් වන්නේ,

(1) ලූක් ශුභාරංචියේ (2) මතෙව් ශුභාරංචියේ

(3) මාක් ශුභාරංචියේ (4) ජොහන් ශුභාරංචියේ

(28) ''දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ'' විශ්ව ලේඛනය ලියන ලද්දේ,

(1) අති උතුම් II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා

(2) අති උතුම් XII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා

(3) අති උතුම් I වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා

(4) අති උතුම් VI වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා

(29) දෙසැම්බර් 08 වන දින සමරනු ලබන මංගල්‍යය වන්නේ,

(1) මරිය තුමියගේ ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳිමේ මංගල්‍යය

(2) මරිය තුමියගේ උපන් මංගල්‍යය

(3) ගාබ්‍රියෙල් දේව දූතයා මරිය තුමියට මංගලම් කීමේ මංගල්‍යය

(4) ලංකා අප ස්වාමිදූවගේ මංගල්‍යය

(30) ''ප්‍රේමය ලැබීමට වඩා ප්‍රේම කිරීමට ද මා යොමු කළ මැනව'' මෙසේ සඳහන් වන්නේ,

(1) කතෝලික සභා ධර්මෝපදේශයේ ය.

(2) උත්තම පූජක යාච්ඤාවේ ය.

(3) අසීසියේ ශු. ෆ්‍රැන්සිස් තුමාගේ යාච්ඤාවේ ය.

(4) මල් උයනේ යාච්ඤාවේ ය.

(31) වැටුපක් නොලබා කරන සේවය හඳුන්වනු ලබන්නේ,

(1) එර්ගොන් (2) ලිටුර්ජියා (3) ලාඕස් (4) ෂමාර්

(32) ශුද්ධ වූ සභාවේ ශික්ෂා පදවල පළමු පදයෙන් අපේක්ෂා කරන කාරණාවක් වන්නේ,

(1) දිව්‍ය පූජාවට සහභාගි විය යුතු බවයි.

(2) මුළු දිව්‍ය පූජා යාගයට සහභාගි වීමයි.

(3) දේව වාක්‍ය පිළිවෙතට අනිවාර්‍යයෙන් සිටිය යුතු බවයි.

(4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගත යුතු බවයි.

(33) යාම යැඳුම සඳහා උපයෝගී කර ගන්නා ප්‍රශංසා ගීත උපුටාගෙන ඇති ශුභාරංචිය වන්නේ,

(1) මාක් ශුභාරංචියේ (2) මතෙව් ශුභාරංචියේ

(3) ලූක් ශුභාරංචියේ (4) ජොහන් ශුභාරංචියේ

(34) කිරි වෙළඳාමේ යන පිරිමි දරුවෙකුට මරිය තුමිය දර්ශනය වූයේ,

(1) පාතිමා නුවරදී ය. (2) පෘතුගාලයේදී ය.

(3) ලූර්දු නුවරදී ය. (4) වේලක්කන්නි නුවරදී ය.

(35) ''නිතර යාච්ඤා කිරීමට'' අපෝස්තුලුවරුන්ගෙන් ලද උපදෙස් සඳහන් ලිපි ඇතුළත් වරණය වන්නේ,

(1) එපීස, 1 කොරෙන්ති (2) 1 කොරෙන්ති, 1 තෙසලෝනික

(3) එපීස, 1 තෙසලෝනික (4) එපීස, අපොස්තුලුවරුන්ගේ ක්‍රියාපොත

(36) උත්පත්ති පොතට අනුව මිනිසාගේ රැකවරණයට ලක් වූ දේව මැවිල්ල මනුෂ්‍ය වාසයට යෝග්‍ය වන්නේ,

(1) ලොව පුරා පැතිර එය යටත් කර ගැනීමෙනි.

(2) සංරක්ෂණය කරමින් පරිභෝජනය කිරීමෙනි.

(3) දරු සම්පත් ලබා වර්ධනය වීමෙනි.

(4) දේව මැවිල්ල මිනිසාගේ භාරකාරිත්වයට දීමෙනි.

(37) ඇතුළාන්ත සාමයට මූලික වන්නේ,

(1) සත්‍යය, යුක්තිය, ප්‍රේමය හා නිදහසයි.

(2) පීඩිතයන් සැනසීමයි.

(3) ප්‍රඥාවන්තකම හා බුද්ධියයි.

(4) කරුණාවන්තව රට තුළ සාමය ඇති කිරීමයි.

(38) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වල ප්‍රධාන තේමාවකි ; එය වන්නේ,

(1) වෛර කරන්නාට යාච්ඤා කිරීමයි.

(2) සතුරන්ට ප්‍රේම කරමින් හිංසා කරන අයට යාච්ඤා කිරීමයි.

(3) දෙවියන් වහන්සේට හා තම සහෝදරයාට ප්‍රේම කිරීමයි.

(4) නින්දා අපහාස ඉවසීමෙන් දරා ගැනීම පිළිබඳවයි.

(39) ශාරීරික පුන්‍යක්‍රියාවලින් අපේක්ෂා කරන්නේ,

(1) මනුෂ්‍යයාගේ මූලික අවශ්‍යතා සම්පූර්ණත්වයට පත් කිරීමයි.

(2) සරණාගතයන්ට, රෝගින්ට පිහිට උපකාර කිරීමයි.

(3) අනාථයන්ට, කුසගින්නේ පෙලෙන්නන්ට පිහිට වීමයි.

(4) සිරකරුවන්ට හා සමාජයෙන් කොන්වුවන්ට උදව් උපකාර කිරීමයි.

(40) එක්වරු ශීලයේ පරමාර්ථයකි,

(1) නිරාහාරශීලීව සිටීමයි.

(2) ආහාරවේල දන් දීමයි

(3) යාච්ඤාවෙන් ජීවත් වීමයි.

(4) තමන්ගේ පාපවලට වන්දි ගෙවීමයි.